ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන

බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 අක් මුදල් ගැළපීම් ගිණුම

වෙනත් ආයතන විසින්, වාර්තා කරන ආයතනය වෙනුවෙන් දරන ලද රු.43,932,466 ක් වූ වියදම් ශේෂය මුළු වියදම සමඟ ගැළපීමට පෙර ශේෂ පිරික්සුම පිළියෙල කිරීම හේතුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා ශේෂ පිරික්සුම අතර එම ප්‍රමාණයෙන් වෙනසක් නිරීක්ෂණය විය.

1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් පුනරාවර්තන වැය විෂයයන් 03 ක් හා ප්‍රාග්ධන වැය විෂයයක් සඳහා සපයා ගෙන තිබුණු රු.31,697,250 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම 2021 අගෝස්තු මාසය වන විටත් වියදම් නොකර ඉතිරි කර තිබීම හේතුවෙන් 2021 අගෝස්තු 28 දිනැති රාජ්‍ය වියදම් සමාලෝචනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය පරිදි අවුරා තැබීමට සිදුවී තිබුණි .

(ආ) සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් පුනරාවර්තන වැය විෂයයන් 07 ක් හා ප්‍රාග්ධන වැය විෂයයන් 03 ක් සඳහා අවශ්‍ය රු.46,097,680 ක් වූ මුළු ප්‍රතිපාදනයම සපයාගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වනවිට මුළු ප්‍රතිපාදනයෙන් රු.14,021,916 ක් හෙවත් සියයට 16 සිට සියයට 58 දක්වා වූ පරාසයකට අයත් ප්‍රතිපාදන ඉතිරිකර තිබුණි.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) වැය විෂයය අංක 1001 යටතේ ප්‍රතිපාදන ඉතිරිය ඉක්මවා රු.7,109 ක බැඳීම් හා බැරකම් වලට එළඹ තිබුණි.

(ආ) වැය විෂයය අංක 1409 යටතේ ප්‍රතිපාදන ඉතිරිය රු.988,704 ක් වුවද 2021 අගෝස්තු 28 දිනැති රාජ්‍ය වියදම් සමාලෝචනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය පරිදි වියදම් අවුරා තැබූ පසු ප්‍රතිපාදන ඉතිරිය රු.162,703 කි. උක්ත වැය විෂයය යටතේ වර්ෂ අවසානයට වූ බැඳීම් වටිනාකම රු.177,589 ක් විය. ඒ අනුව රු.14,886 ක ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට එළඹ තිබුණි.

2.3 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව, රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වන අධිකාරිය අනුව ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තැබීමට කටයුතු කළ යුතු වුවත් ඇප තැබිය යුතු නිලධාරීන් හඳුනා ගෙන, ඇප තැබීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලැසුම් කිරීම

(අ). ප්‍රසම්පාදන සැලැස්ම

පුනරාවර්ථන වැය විෂයයන් 03 ක් හා ප්‍රාග්ධන වැය විෂයයක් සඳහා සැලසුම්ගත ප්‍රසම්පාදන වියදම් ඉක්මවා සියයට 23 සිට සියයට 262 දක්වා වූ පරාසයක වියදම් දරා තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන සැලසුම් සකස් කිරීම නිසි කළමනාකරිත්වයෙන් සිදුකර නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) අභ්‍යන්තර විගණන සැලැස්ම

දෙපාර්තමේන්තුව යටතේ පවතින අංශ 3 කට අයත් විවිධ ව්‍යාපෘති හා ඒ යටතේ ළඟා ක්‍රගැනීමට බලාපොරොත්තු වන විගණන ක්ෂේත්‍ර 31 ක් සඳහා අභ්‍යන්තර විගණනය සැලසුම් කර තිබුණද ක්ෂේත්‍ර 07 ක් කෙරෙහි පමණක් අභ්‍යන්තර විගණන අවධානය යොමු කර තිබුණි.

3.1.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

මරද මඩු දේවස්ථානයේ රාජකාරි කටයුතු සඳහා පැමිණෙන දෙපාර්තමේන්තු නිළධාරීන් හා අනෙකුත් රාජ්‍ය නිලධාරීන් සඳහා නවාතැන් පහසුකම් වෙනුවෙන් වන්දනා ගෘහයක් ඉදිකිරීමේ පළමු අදියරට අදාලව රු.2,128,305 ක මුදලක් මන්නාරම් දිස්ත්‍රික් ලේකම් මඟින් කොන්ත්‍රාත්කරුවෙකුට ගෙවා තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) උක්ත සඳහන් ගොඩනැගිල්ලේ පළමු අදියරට අදාලව ඇස්තමේන්තුවක් ලබා දෙන ලෙස දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් 2016 ජුනි 28 දින සිදුකර තිබූ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් මන්නාරම දිස්ත්‍රික් ලේකම් විසින් ඇස්තමේන්තු සහ මැණුම්පත් ඉදිරිපත් කිරීම මාස 05 ක කාල පමාවකින් පසු 2016 නොවැම්බර් 25 දින සිදු කර තිබුණි.

(ආ) 2017 සැප්තැම්බර් 13 දිනෙන් ආරම්භකර 2017 දෙසැම්බර් 11 දින අවසන් කළ යුතු කොන්ත්‍රාත්තුවේ පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු 2017 දෙසැම්බර් 23 දින අවසන් කර තිබූ අතර ඉදිරි ඉදිකිරීම් කටයුතු සඳහා ඇස්තමේන්තුවක් පිළියෙල කරන ලෙස 2017 සැප්තැම්බර් 14 දින දිස්ත්‍රික් ලේකම් විසින් දිස්ත්‍රික් ඉංජිනේරුවරයා වෙත දන්වා තිබුණි. ඒ සඳහා දිස්ත්‍රික් ඉංජිනේරුවරයා විසින් පිළිතුරු සපයා තිබුණේ 2019 අප්‍රේල් 05 වන අතර එදින තෙක් පසු විපරම් කටයුතු කිසිවක් සිදුකර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘතියේ පළමු අදියරේ කටයුතු වෙනුවෙන් 2017 දෙසැම්බර් 08 දින වන විට කොන්ත්‍රාත්කරුට රු.2,128,305 ක මුදලක් ගෙවා තිබුණද, දුර්වල තත්ත්ව පාලනය හේතුවෙන් වසරක වගකීම් කාලය ගතවීමටත් පෙර කණු පාදම් ඉරිතලා ඇති බැවින් ඉතිරිව ඇති ඉදිකිරීම් කටයුතු සඳහා ඇස්තමේන්තු පිළියෙල කළ නොහැකි බවත්, ඒ සඳහා

ගොඩනැඟිලි දෙපාර්තමේන්තුවේ උපදේශකත්වය ලබා ගන්නා ලෙසත් දිස්ත්‍රික් ඉංජිනේරුවරයා විසින් දන්වා තිබුණි.

(ඉ) ගොඩනැඟිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරුවරයා විසින් ඉදිකිරීමේ කණු පාදම් **(Column Footing)** නිරීක්ෂණය කළ බවද මැණුම් පත්‍රයේ 225**mm** බැගින් දක්වා ඇති කණු පාදම්වල ඝනත්වය ඇතැම් පාදම් 100 **mm** ලෙසත් ඇතැම් පාදම්වල 60 **mm** ලෙසත් නිරීක්ෂණය වූ බවත් එම නිසා ගොඩනැඟිල්ලේ ශක්තිමත් බව නිර්ණය කළ නොහැකි බවත් දන්වා තිබූ අතර මඩු ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ තාක්ෂණික සහකාර නිලධාරි විසින් කණු පාදම් 255 **mm** ක ඝනත්වයට වඩා වැඩි ඝනත්වයකින් යුක්ත බව සහතික කර තිබුණි. ඒ අනුව ඉදිකිරීම් සම්බන්ධයෙන් පරස්පර නිර්දේශ ඉදිරිපත් කර තිබූ බව නිරීක්ෂණය විය.

(ඊ) කොන්ත්‍රාත් භාරගැනීමේ ලිපිය අනුව **(Letter of Acceptance)** රු.96,000 ක් වූ කාර්යසාධන ආරක්ෂණයද **(Performance Security)** 2018 ජනවාරි 08 දිනෙන් අවසන් වී තිබුණි. ව්‍යාපෘතියේ ව්‍යාපෘති අඩුපාඩු පැවතියද, මන්නාරම දිස්ත්‍රික් ලේකම්, මඩු ප්‍රාදේශිය ලේකම් හෝ ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුව විසින් නිසි අධීක්ෂණය සහ පසු විපරම් කටයුතු සිදු කර නොතිබුණු අතර 2019 ජනවාරි 30 දින රු.106,415 ක් වූ රැඳවුම් මුදලද නිදහස් කර තිබුණි.

(උ) රු.මිලියන 2.5 ක වියදමක් දරමින් සිදු කරන ලද ගොඩනැඟිල්ල ඉදිකිරීමේ මූලික කටයුතු 2017 දෙසැම්බර් 23 දින අවසන් කර තිබුණද ඉදිකරන ලද කොටසේ පවතින දුර්වලතා සහ නිලධාරීන් අතර සම්බන්ධීකරණයක් නොපැවතීම හේතුවෙන් ස්ථානීය පරීක්ෂණය සිදු කළ 2020 පෙබරවාරි 18 දින වන විටත් ගොඩනැඟිල්ලේ ඊළඟ අදියරේ ඉදිකිරීම් කටයුතු ඇණහිට තිබුණි. ඒ අනුව ඉහත රු.මිලියන 2.5 ක වියදම නිෂ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය කෙරේ.

3.2 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ අනුමත රියැදුරු තනතුරු 02 න් එක් තනතුරක් පුරප්පාඩු වී පැවතීම හේතුවෙන් දෙපාර්තමේන්තුව සතුව පවතින වාහන දෙකෙන් එකක් 2020 ජනවාරි 28 දින සිට නිශ්කාර්යව පැවතුණි.

3.3 පාඩු හා හානි

2019 සැප්තැම්බර් 12 දින අනතුරට ලක්වූ අංක **NB 2558** දරන වාහනයට සිදුවූ අලාභය වූ රු.137,707 ක් මෙතෙක් අයකර හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

4. යහපාලනය

අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුකූලව අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම පිණිස සුදුසු විගණනවරයෙකු පත්කරනු ලැබීය යුතු වුවත් දෙපාර්තමේන්තුවේ විගණන කටයුතු සඳහා කළමණාකරන සේවා නිලධාරියෙකු පත් කර තිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ අනුමත මුළු තනතුරු සංඛ්‍යාව 61 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සහකාර අධ්‍යක්ෂ, ගණකාධිකාරී, සංවර්ධන නිලධාරී, රියැදුරු සහ කාර්යාල කාර්ය සහයක තනතුරු 01 බැගින් තනතුරු 05 කට සහ සංවර්ධන නිලධාරී තනතුරු 03 කට අදාලව පුරප්පාඩු 08 ක් පැවතිණි.

එච්.එම්.රණසිංහ බණ්ඩා
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය 04

කාර්ය සාධක දර්ශක - ආයතනයේ කාර්ය සාධක දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

මූලික වගකීම	සැලසුම්කර ඇති ප්‍රධාන කාර්යයන්	ප්‍රමුඛ කාර්යය සාධක දර්ශක	ඇස්තමේන්තුගත සංශෝධිත වාර්ෂික පිරිවැය (රු.මිලි. - අදාල නම් පමණි)	ප්‍රගතිය		බැහැරවීමක් ඇත්නම් එයට හේතුව
				භෞතික (ප්‍රමාණාත්මක %)	මූල්‍ය %	
පුනරාවර්තන වියදම්						
1409	කිතුනුදහම පිළිබඳ ප්‍රකාශන මිලදී ගැනීම හා දහම් පාසල් පුස්තකාල වැඩසටහන	දහම් පාසල් 85ක් සඳහා පොත් ලබා දීම	1.5	100%	97%	-
	ජනවන්දනා, කිතුනු කලා ශිල්ප හා සංස්කෘතික කටයුතු	කිතුනු කලා ශිල්ප හා සංස්කෘතික කටයුතු නගා සිටුවීම හා දිරිගැන්වීම	1.1	-	-	කොවිඩ් 19 වසංගතය හේතුවෙන් සංස්කෘතික කටයුතු නොපැවැත්වීම නිසා මුදල් අමාත්‍යාංශ 2021.08.28 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය හා අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ අංක 21/1596/34/134 හා 2021.08.31 දිනැති ලිපිය අනුව ප්‍රතිපාදන අත්හිටුවා ඇත.
2-1409	ක්‍රිස්තියානිආගමික සාහිත්‍ය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	නවක කිතුනු කලාකරුවන් ඇගයීම හා පැරණ කලාකරුවන් ඇගයීමේ වැඩසටහන් 5ක් සඳහා	1.2	100%	100%	-

3-1501	දහම්පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම්	පදවි 12 ආවරණය වන පරිදි ගුරුවර ගුරුවරියන්ට නිල ඇඳුම් ලබා දීම	30	-	-	මුදල් අමාත්‍යාංශ 2021.08.28 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය හා අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ අංක 21/1596/34/134 හා 2021.08.31 දිනැති ලිපිය අනුව ප්‍රතිපාදන අත්හිටුවා ඇත.
13-1501	දහම්පාසල් ගුරුවරුන් සඳහා ආධාර (දැහැමි දිරිය හා පුස්තකාල දීමනාව)	දහම් ගුරුවරුන් 15624ක් සඳහා	78.1	100%	100%	-
1508	මූල්‍යඅවශ්‍යතා වලදී දේවස්ථාන සහ අනෙකුත් ආගමික සංවිධාන වලට සහය වීම	දේවස්ථාන 03ක් සඳහා	0.5	100%	60%	-
	අධ්‍යාත්මික පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන් හා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්	දිවයින පුරා වැඩසටහන් 11ක් සඳහා	2.5	100%	88%	-
	පාස්කු මංගල්‍යය වැඩසටහන්	පාස්කු පසන් සංරක්ෂණ වැඩසටහන හා පාස්කු උත්සව කටයුතු පැවැත්වීම	5.3	100%	88%	-
	ජාතික නත්තල් වැඩසටහන්	රාජ්‍ය නත්තල් උත්සවය, නත්තල් චිත්‍ර තරඟය හා මුද්දර නිකුත් කිරීම	2.5	100%	92%	-
	අනෙකුත් ජාතික හා ආගමික අවස්ථා සංවිධානය කිරීම හා විවිධ කටයුතු	ජාතික නිදහස් දිනය පැවැත්වීම	0.1	100%	80%	-

4-1508	වන්දනාගමන් ආඥාපනත යටතේ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රධාන දේවස්ථාන උත්සව	මංගල්‍යන් 21ක් සඳහා	6.98	90%	96%	-
5-1508	ආගමිකභා දහම් පාසල් ක්‍රියාකාරකම්	ජාතික හා පදවි මට්ටමින් ආගමික අධ්‍යාපන වැඩසටහන් 18ක් සඳහා දායකත්වය දැක්වීම	1.1	100%	60%	-
5-1508	බයිබල්දහම් දැනුම පිළිබඳ පැන විසඳුම් තරඟය	ශ්‍රී ලංකාවේ සියලුම කතෝලික දරුවන් සඳහා බයිබල් දැනුම මිනුම් තරඟය පැවැත්වීම තුලින් දරුවන්ගේ බයිබලීය දැනුම වර්ධනය	2.7	100%	100%	-
ප්‍රාග්ධන වියදම්						
10-2205	දේවස්ථානවැඩිදියුණු කිරීම	දේවස්ථාන 37ක් සඳහා	30	75%	74%	අක්මුදල් නොලැබීම හා ගොඩනැගිලි අමුද්‍රව්‍ය හිඟ වීම නිසා ප්‍රසම්පාදන කටයුතු ඇණ හිටීම
11-2205	දේවස්ථානයටිතල පහසුකම් සංවර්ධනය කිරීම	දේවස්ථාන 03ක් සඳහා	15	95%	61%	ප්‍රමාණවත් පරිදි අක්මුදල් නොලැබීම
15-2205	මඩුදේවස්ථානයේ අභ්‍යන්තර මාර්ග සංවර්ධනය	සිද්ධස්ථාන 01ක් සඳහා	22	100%	100%	-
16-2205	කිතුණු ආගමික ස්ථාන පුනරුත්ථාපනය හා සංවර්ධනය	දිවයින පුරා පිහිටි ආගමික මධ්‍යස්ථාන සඳහා	10.9	100%	100%	-

පරිච්ඡේදය 05
තිරසාර සංවර්ධන අරමුණු(SDG)සපුරා ගැනීමේ කාර්ය සාධනය
හඳුනා ගත්තා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය/ අරමුණ		ඉලක්ක	ඡයග්‍රහණ දර්ශක	මේ දක්වා ඡයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය 0%-49% 50%-74% 75% - 100%
1409	කිතුනු දහම පිළිබඳ ප්‍රකාශන මිලදී ගැනීම හා දහම් පාසල් පුස්තකාල වැඩසටහන	පරිපූර්ණ,සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	2030 වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම හා කුසලතාවයන් ලබා සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය සහ ප්‍රවණඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිමය වශයෙන් දායකවීම.	75%-100%
	ජනවන්දනාව, කිතුනු කලාශිල්ප හා සංස්කෘතික කටයුතු	පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	2030 වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම හා කුසලතාවයන් ලබා සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය සහ ප්‍රවණඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිමය වශයෙන් දායකවීම.	75%-100%

1508	මුල්‍ය අවශ්‍යතා වලදී පල්ලි සහ අනෙකුත් ආගමික සංවිධාන වලට සහායය වීම	සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරි ගැන්වීම	9.1 ආර්ථික සංවර්ධනය හා මානව යහපැවැත්ම වෙනුවෙන් සියලුදෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශය විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදු කරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම	75%-100%
	අධ්‍යාත්මික පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන් හා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සංවිධානය කිරීම	නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම.	හානිකර මද්‍යසාර භාවිතය සහ අන්තරායකාරී ඖෂධ භාවිතය වැලැක්වීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම	50%-74%
			දුම්කොළ භාවිත පාලනය කිරීම සඳහා වූ ලෝක සෞඛ්‍ය සංවිධානයේ වැඩ සැලැස්ම සියලුම රටවලට අදාල වන පරිදි ශක්තිමත් කිරීම හා ක්‍රියාවට නැංවීම	
	පාස්කු මංගල්‍යය වැඩසටහන් සංවිධානය කිරීම	සෑම කිතුණුවකගේම අධ්‍යාත්මික ජීවිතය ශක්තිමත් කරලීම	සාමකාමී සමාජයකට කිතුණුවන් මෙහෙයවීම	0%-49%
	ජාතික නත්තල් වැඩසටහන් සංවිධානය කිරීම	‘‘ජේසු උපත’’ මඟින් ගෙනෙන ප්‍රේමයේ පණිවිඩය ජාතික උත්සවය හරහා සමාජානුයෝජනය කරලීම.	සාමකාමී සමාජයකට කිතුණුවන් මෙහෙයවීම	75%-100%
	අනෙකුත් ජාතික හා ආගමික අවස්ථා සංවිධානය කිරීම හා විවිධ කටයුතු	සෑම කිතුණුවකගේම අධ්‍යාත්මික ජීවිතය ශක්තිමත් කරලීම	සාමකාමී සමාජයකට කිතුණුවන් මෙහෙයවීම	75%-100%
02-1508	කිතුනු ආගමික සාහිත්‍ය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	ලේඛණ,රංගනය,මඟින් පෞරුෂත්වය වර්ධනය කිරීම.	කිතුණු කලා රසාස්වාදන උසස් මට්ටමකට ගෙන ඒම හා එ සඳහා උනන්දුවක් දක්වන්නන් ඇගයීමකට ලක් කිරීම.අනාගතයට ප්‍රශස්ත කලාකරුවන් දයාද කිරීම.	0%-49%

03-1409	දහම් පාසල් ගුරුවරුන් සඳහා නිළ ඇඳුම් ලබා දීම	පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	2030 වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම හා කුසලතාවයන් ලබා සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය සහ ප්‍රවණඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිමය වශයෙන් දායකවීම	75%-100%
04-1501	වන්දනා ගමන් ආඥා පණත යටතේ ප්‍රකාශිත දේවස්ථානයන්ගේ මංගල්‍යයන් පැවැත්වීම	නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම	ලෝකයේ ස්භාවික සහ සංස්කෘතික උරුමයන් රැක ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම	75%-100%
05-1508	ආගමික අධ්‍යාපනය හා දහම් පාසල් ක්‍රියාකාරකම්	පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	2030 වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම හා කුසලතාවයන් ලබා සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය සහ ප්‍රවණඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිමය වශයෙන් දායකවීම	50%-74%
13-1508	දහම් පාසල් ගුරුවරුන් සඳහා දැහැමි දිරිය දීමනාව	පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	2030 වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම හා කුසලතාවයන් ලබා සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය සහ ප්‍රවණඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිමය වශයෙන් දායකවීම	75%-100%

10-2205	දේවස්ථානයන්හි ඉදිකිරීම්, පුනරුත්ථාපනය කිරීම් හා යටිතල පහසුකම් සංවර්ධනය	නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම	ලෝකයේ ස්භාවික සහ සංස්කෘතික උරුමයන් රැක ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම	75%-100%
11-2205	වන්දනා ගමන් ආඥා පණත යටතේ ප්‍රසිද්ධියට පත් කර ඇති සිද්ධස්ථානවලට පැමිණෙන වන්දනාකරුවන්ට අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම	නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම	ලෝකයේ ස්භාවික සහ සංස්කෘතික උරුමයන් රැක ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම	75%-100%
15-2205	මඩු සිද්ධස්ථානයේ යටිතල පහසුකම් සංවර්ධනය	නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම	ලෝකයේ ස්භාවික සහ සංස්කෘතික උරුමයන් රැක ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම	75%-100%

දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන බොහෝ කාර්යයන් ප්‍රමාණාත්මක ව මැනිය නොහැකි කාර්යයන් වීම මත නිශ්චිත ව තිරසර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීම දුෂ්කර විය. එසේ වුව ද දෙපාර්තමේන්තු දැක්ම හා මෙහෙවර අනුව හඳුනාගන්නා ලද තිරසර අරමුණු කරා බොහෝ දුරට ළඟා වීමට දෙපාර්තමේන්තුවට හැකිවිය. **කොවිඩ් වසංගතය තත්වය** හේතුවෙන් පදවි හා ජාතික මට්ටමෙන් සංවිධානය කොට තිබූ වැඩසටහන් බොහොමයක් අවලංගු කිරීමට හා කල් දැමීමට සිදුවීම තිරසර සංවර්ධන අරමුණු කර ළඟා වීමට බාධාවක් විය. එසේ වුව ද විවිධ විකල්ප ක්‍රම උපයෝගී කර ගනිමින් හැකිතාක්දුරට ඉලක්කගත කාර්ය සාධනය කරා ළඟා වීමට දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

පරිච්ඡේදය 06 –මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජේෂ්ඨ	03	01	02
තෘතියික	01	01	00
ද්විතියික	50	45	5
ප්‍රාථමික	07	05	02

6.2. සේවක සංඛ්‍යා කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ.සහකාර අධ්‍යක්ෂ, ගණකාධිකාරී යන තනතුරු 03න් සහකාර අධ්‍යක්ෂ තනතුර හැර අනෙක් තනතුරු තුනම පුරප්පාඩුව පැවති අතර, අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීම සඳහා සහකාර අධ්‍යක්ෂ පත් කරන ලද අතර, ගණකාධිකාරී තනතුර සඳහා විශ්‍රාමික නිලධාරියෙකු සේවයේ යොදවා ගන්නා ලදී. සංවර්ධන නිලධාරී තනතුරු 03ක් පුරප්පාඩු ව පවතින අතර, සංවර්ධන නිලධාරීන් නොමැති පලාත් වල වැඩසටහන්, තරඟ හා සංවර්ධන කටයුතු දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරීන් යොදවා ආවරණය කර ගැනීමට කටයුතු කරන ලදී. ඒ අනුව පවත්නා මානව සම්පත අභිප්‍රේරණය කරමින් ඔවුන්ගේ ආයකත්වය උපරිම වශයෙන් දෙපාර්තමේන්තු කාර්ය සාධනය පවත්වා ගැනීමට උපයෝජනය කොටගෙන ඇත.

6.3. මානව සම්පත් සංවර්ධනය

අනුඅංකය	වවුචරය සැකසූදිනය	පුහුණු වැඩසටහන	ගෙවීම් කරන්නාගේනම	වියදම (රු)
1	2021.01.15	ගබඩාකළමණාකරනය, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය හා වත්කම් අපහරණය	නිපුණතා සංවර්ධන අරමුදල	10,500.00
2	2021.01.15	රජයේප්‍රසම්පාදන ක්‍රියාවලිය	නිපුණතා සංවර්ධන අරමුදල	7,000.00
3	2021.02.11	දෙමළපංති	එම්.ටී.එස්.නහාස්	24,300.00
4	2021.03.16	කාර්යාලකළමනාකරණය හා මුදල් රෙගුලාසි	නිපුණතා සංවර්ධන අරමුදල	35,000.00
5	2021.03.18	කනිෂ්ඨසේවකයින් සඳහා අදාල රාජකාරී පුහුණුව	ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ පුහුනු මධ්‍යස්ථානය	4,000.00
6	2021.03.18	දෙමළපංති	එම්.ටී.එස්.නහාස්	26,100.00

7	2021.03.19	Advance Exel	මිලෝදාමූල්‍ය අධ්‍යයන ආයතනය	39,000.00
8	2021.03.23	කාර්යාල කාර්යසහයකයන් සඳහා විනය හා කාර්යාල ආචාර විධි	නිපුණතා සංවර්ධන අරමුදල	8,500.00
9	2021.03.30	නිලබැංකු ගිණුම් නඩත්තුව	නිපුණතාසංවර්ධන අරමුදල	3,750.00
10	2021.04.09	Event Management Programme	මිලෝදාමූල්‍ය අධ්‍යයන ආයතනය	299,000.00
11	2021.05.05	දෙමළපංති	එම්.ටී.එස්.නහාස්	15,300.00
12	2021.09.22	Certificate Course in English Language	නිපුණතාසංවර්ධන අරමුදල	25,000.00
13	2021.12.14	GOV. PAYROLL SYSTEM	මිලෝදාමූල්‍ය අධ්‍යයන ආයතනය	5,000.00
14	2021.12.15	වෘතීය සංවර්ධනපුහුණුව	නිපුණතාසංවර්ධන අරමුදල	28,000.00
14	12/16/2021	එන්.අයි.එල් .එස්.ආයතන	රජයේවාහන නඩත්තුව	10,000.00
15	12/28/2021	එස්.කුසලකුමාරන් මයා	මුදල්රෙගුලාසි	12,000.00
			එකතුව	**552,450.00**

දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා වාර්ෂිකව අවම පැය 14 ක පුහුණුවක් ලබාදිය යුතු බැවින් හා දෙපාර්තමේන්තුව මගින් වර්ෂය පුරා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන නිසා සියලුම නිලධාරීන්ට එම වැඩසටහන් සාර්ථකව සිදුකිරීමට උපකාරී වන වැඩසටහන් කළමනාකරණය (Event Management) පිළිබඳ දෙදින පුහුණුවක් ලබාදෙන ලදී.

කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් අපේක්ෂිත පරිදි පුහුණුවීම් නිලධාරීන්ට ලබා දීමට නොහැකි විය.

පරිච්ඡේදය 07

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1.	**පහතසඳහන්මූල්‍යප්‍රකාශ/ ගිණුම්නියමිතදිනටඉදිරිපත්කොටතිබේ**			
1.1.	වාර්ෂිකමූල්‍යප්‍රකාශ	අනුකූලවේ		
1.2.	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූලවේ		
1.3.	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නොවේ		
1.4.	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.5.	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.6.	වෙනත්	අදාල නොවේ		
2.	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1.	රාජ්‍යපරිපාලනචක්‍ර ලේඛ 267/2018 අනුවස්ථාවරවත්කම්ලේඛනයයාවත්කාලීනකරපවත්වාගෙනයාම	අනුකූලවේ		
2.2.	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.3.	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.4.	අභ්‍යන්තරවිගණනවාර්තාලේඛනයයාවත්කාලීනකරපවත්වාගෙනයාම	අනුකූලවේ		
2.5.	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
2.6.	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.7.	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.8.	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		

2.9.	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10.	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11.	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3.	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1.	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2.	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3.	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4.	2014.05.11 දිනැතිඅංක171/2004 දරණරාජ්‍යාගිණුම්චක්‍ර ලේඛයඅනුව, රජයේපඩිපත්මෘදුකාංගපැකේජයභාවිතාකිරීමේදීග ණකාධිකාරිවරයන්ගේපාලනයටයටත්වකටයුතුකිරී ම	අනුකූල වේ		
4.	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂිකඅභ්‍යන්තරවිගණනසැලැස්මසකස්කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස්කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

5.	**විගණන විමසුම්**			
5.1.	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්ති ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	2021 වර්ෂයේ සිට සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.	
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	2021 වර්ෂයේ සිට සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර ඇත.	
7.	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව,අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 4ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල වේ		
8.	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකණ චක්‍ර ලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කෝම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු ප් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොමිෂන්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ශණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ශණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රෙල්ඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	මු.රෙ.109 යටතේ පොතෙන් කපා හැරීමට කටයුතු කරමින් පවති.	
9.3	වාහන ලෝග් පොත් පවත්වා ගනිමින් ඒවා සාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛයේ 3.1 ඡේදයේ සඳහන් වියි විධාන ප්‍රකාරව ,වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ	.	
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බලකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාෂ වලින් අනාවරණය වූ හා ගැලපුම කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇරතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවාගේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉදිරි ප්‍රතිපාදන සීමාව නෙඉක්මවන පරිදි බැරකම්වලට	අනුකූල වේ		

12	**එලඹීමරජයේ නිලධාරින් ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුලු කර තිබීම.	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙමු.රේ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සදහා වන පාලන ගිණුම යාවත්කාලින කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2	මු.රේ.371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම,එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රේ.371 ප්‍රකාරව අනුමත සිමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව රැස් කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස්කර තිබූ ආදායම්,තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රේ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		
16	**මානව සම්පත් කළමණාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සිමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ		

16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍ර ලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමණාකරණ සේවා දේපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛණයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර , වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයා ගේ ප්‍රශංසා /චෝදනා පළ කිරීමට පහසුකම් සළසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	2022 වර්ෂයේ සිට සියලුම වාර්තා ඉදිරිපත් කිරීමට නියමිතයි.	
18	**පුරවැසි ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2008(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශ චක්‍ර ලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥාප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධික්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැළැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැළැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහා ම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැළැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		

19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අදාල වේ		
19.4	ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳවගකිම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩු පාඩු නිවිරදි කොට තිබීම	අනුකූල වේ		